සන්නස SANNASA

පන්හිඳයි පින්සලයි

# බන්ඩුල හරිස්චන්ද්‍ර මාස්ටර්

**පින්සල ඇඳි පුටුවේ දිගා වුණා. පින්ට දැන් එක එල්ලයේ පෙනෙන්නේ ඊයේ පෙරේදා රාමු කරලා ගෙනාව බන්දුල හරිස්චන්ද්‍ර මහත්තයාගේ චිත්‍රය. ඇත්තටම රාමුවෙන් චිත්‍රයට කළඑළියක් වැටුණා නේද කියලා හිතුනා පින්ට.**

"රාමු කරන එකත් කලාවක්..... !" පින්සල තමන්ටම කියාගත්තා. කවුරුන් හිටියත් නැතත් තමන්ටම කියාගන්න එක පින් ගේ පුරුද්දක් ! අනිත් අය උත්තර බැන්දත්, නැතත් ඒ කතාවලට පැටලුනත්, නැතත් පින්ට ගානක් නෑ.

"බන්දුල හරිස්චන්ද්‍ර මහත්තයා මොනතරම් නිහතමානීද ?" පින් තමන් කුඩා කාලේ ඉඳන්ම පෙම් බැඳපු සිත්තරාව දැක බලාගත්තේ මෙදා වතාවේ ලංකාවට ගිය වෙලාවේ. බන්දුල මාස්ටරුයි බිරිඳ කුසුම් මංගලිකායි මුණ ගැහෙන්න පින් ගියේ. කල් ඇතුවම දැනුම් දීලා. කුසුම් මංගලිකා බන්දුල මාස්ටර්ගෙන් චිත්‍ර ඉගෙන ගන්න ආව සිසුවියක්. ඇයත් හොඳ චිත්‍ර ශිල්පිනියක්.

"බන්දුල මාස්ටර්ගෙ චිත්‍රවලට කැමති හිතුනෙ ඇයි ?" පින් තමන්ගෙන්ම අහගන්නවා.

"ඉස්කෝලේ තුනේ හතරේ පන්තිවල ඉන්න කාලේ ඉඳන්ම ඇහැ ගියේ දිනපතා පත්තරේ අන්තිම පිටුවේ කොටස් වශයෙන් පළවුන චිත්‍රකතාවලට. කොටු තුනයිනේ දවසකට පළ වෙන්නේ. ඒ කොටු තුන ඇතුලේ බන්දුල මාස්ටර් මොනතරම් දෙයක් කළාද ඇත්තටම ?. ඊකනේ ඒවා කපලා පරණ ඇක්සයිස් පොත්වල අලවා ගත්තේ. අන්තිමට හොඳ චිත්‍ර කතා පොත් ටිකක් ! බන්දුල මහත්තයාගේ විතරක් නෙවෙයි දයා රාජපක්ෂ මහත්තයාගෙත්......"

"ඇයි ජනක රත්නායක මහත්තයාගේ චිත්‍රකතා ?" පින්ගේ තනියම කියවිල්ල ඇහුණ පන්හිඳ එකතු වුණ.

"ජනක රත්නායක මහත්තයා එක්කහු වුනේ පස්සෙනේ. අළුත් පන්නෙට අඳින පළඳින තරුණ චරිත අඳින්න දර්ශන අඳින්න නම් ඉතිං දක්ෂකම් පෑවේ උන්නැහේ තමයි. ඒත් බන්දුල මාස්ටර් හැමවිදියම චරිතවලට උපරිම සාධාරණය කළා. ආගමික නායකයින්, තරුණ බාල මහළු චරිත, වීර චරිත, පෙරදිග අපරදිග චරිත එක එක තරාතිරම්වල චරිත..... මේ හැම එකක්ම.... ඒ ඒ චරිත රූපයෙන් මවන්න හරි රුසියා."
"ඒ විතරක්ද ? ඇඳුම් පැළඳුම් ? සත්තු ? ඒ ඒ රටවල්වල ඇඳුම් පැළඳුම් විතරක් නෙවෙයි, ගොඩනැගිලිවල හැටි, ගහකොළ පරිසරය වගේ දේවල් ඒ ඒ හැටියෙන්ම ඇන්ද හැටි මතකද ? මට මතක් වෙනවා නීග්‍රෝ ජාතිකයින්, සුදු ජාතිකයින්, ඉන්න ග්‍රීක් සුදු ජාතිකයින්, ආරබි නිසොල්ලාසයේ චරිත, වට පිටාව ඇපි දැනගත්තේ මේ චිත්‍රවලින්."



"හැබැයි ඉතින් චිත්‍ර කතා කියවන එකට ගෙවල්වලින් නම් කැමැත්තක් ලැබුණෙ නෑ ඒ කාලෙ. ඔක්කොම හොරෙන් හොරෙන් තමා......." මේ කතාව අහගෙන උන්නු පැන්සලත් තමුන්ගේ මතකයට හිත යැව්වා.

"මට මතක් වෙනවා නව යුගය පත්තරේ පළවෙච්ච "නස්රුදීන්" කතාවලට ඇඳපු විකට රූප. නස්රුදීන්ගේ කතා සිංහලට පරිවර්තනය කරපු පර්සි ජයමාන්න මහත්තයා බන්දුල හරිස්චන්ද්‍ර මහත්තයා ගැන කියලා තියෙනවා මෙහෙම." පන් නස්රුදීන්ගේ කතා එකතු කරලා ගුණසේන සමාගමෙන් පළ කරපු පොතක් පෙරලුවා.

"මේ කතා ඉදිරිපත් කිරීමේදී ඔබ ඉදිරියට ආ නස්රුදීන්ගේ රූප කායේ මැවුම්කරු වූයේ ප්‍රවීණ චිත්‍ර ශිල්පී බන්දුල හරිස්චන්ද්‍රයන්ය. ලොව පුරා චිත්‍රශිල්පීන් නස්රුදීන් දුටුවාට වඩා වෙනස් අයුරකින් ඔහු නස්රුදීන් දුටුවේය. නස්රුදීන්ගේ බුද්ධිමත්භාවය ඔහු දුටුවේ ලොකු මොළයක් ඇතැයි හැඟවෙන පමණ ඉක්මවා විශාල කළ තලප්පාවකිනි....."

පර්සි ජයමාන්න.

"බන්දුල හරිස්චන්ද්‍ර මහත්තයා චිත්‍රකතාවලට විතරක් හිරවෙලා හිටියේ නෑ. පහුගිය අවුරුදු පහක් විතර කාලයක් තිස්සේ මං ලංකාවට ගියාම මාස්ටර්ව මුණ ගැහෙන්න උත්සාහ කළා. පන්සල් කිහිපයකම චිත්‍ර නිර්මාණය කළේ මාස්ටර්. මෑතක් වෙනකම්ම එක එක පත්තරවල පළ වෙන ලිපි, කෙටි කතා වෙනුවෙන් චිත්‍ර ඇන්දා. ඒවා බොහොමයම පාට පාට චිත්‍ර. දිය සායම්, පැස්ටල්, පාට පැන්සල් දේවල් පාවිච්චි කරයි ඇන්දේ. තමන්ටම හුරු විකාර රූපී ක්‍රමයකටත් මේ අතරේ ඇන්දා. අපි ඇබ්ස්ට්‍රැක් (ශ්‍රිචර්ජච) චිත්‍ර කියලා කියන්නේ අපි පෝර්ට්‍රේට් (ඡදරචර්සච්) කියලා කියන ආලේඛ්‍ය චිත්‍ර ඇඳපු වෙලාවලුත් තියෙනවා. ඒවායින් සමහර ඒවා විකට ස්වරූපයේ ඒවා. සැමුවෙල් රොද්‍රිගු මහත්තයාව ඇඳලා තිබුණා මට මතකයි " අමාරිස් අයියා" කියන පොතේ පිට කවරෙට.

"පින් එහෙම කියනකොට මතක් වෙන්නේ බන්දුල හරිස්චන්ද්‍ර මාස්ටර් ඇඳපු පොත්වල පිට කවර ගැන. හරි සෞම්‍ය වර්ණ සංකලන යොදාගෙන අඳින්න උනන්දු වුන බවක් තමයි පෙනෙන්නේ. චිත්‍ර කතාවලදී රූපවල හැඩරුව පෙන්නන්න වටේට කළු ඉරිවලින් අඳින අවුට් ලයි න්ස් (Out Lines) යොදා ගන්නේ නැතිව පාටවලින්ම රූප ඉස්මතු කරගන්න රූප තමයි පොත් පිටකවරවලට හුඟක් වෙලාවට මාස්ටර් යොදාගන්නේ." ඒ පැන්.

"දැං බලන්න ! බුද්ධ රූපය වුනත් ඇන්දේ තමන්ගේ නිර්මාණාත්මක විදියකට." ඒ පන්.

"මං ඇහුවා ඔය ගැන." පින් හරස් කැපුවා. "මොකද, එහෙම රූපයක් රාමු කරලා තියෙනවා මාස්ටර්ගේ ගෙදර. හිස මුදුන තරමක් උස් බව පොත පතේ තියෙනවා මිසක්, හිසකේ කැටියක් හිස මුදුනේ බැඳගෙන බුදුරජාණන් වහන්සේ හිටිය නැති බවය මාස්ටර් කිව්වේ. ඉතිං ඒ අනුවයි මාස්ටර් අඳින බුද්ධ රූප නිර්මාණය වුණේ." ඒ පින්.

"තමන්ගේ චිත්‍රවලට නොයෙක් ස්වරූප කවන්නත් බන්දුල හරිස්චන්ද්‍ර මහත්තයා එක එක විදියේ තමන්ගෙම ක්‍රමවේද යොදාගෙන තියෙනවා. ත්‍රිමාණ බව, බොඳබව පෙන්නන්න සමහරවිට තමන් ඇඳපු වර්ණ චිත්‍රයට මතුපිට එහෙම්පිටින්ම වෙනමම සායම් පටලයක් හරි සියුම් පාටකූරු තැවරීමක් හරි අතුරනවා. ඒ වගේම ඒක කෝණවලින් බලලා චරිත, ගහකොළ, සත්තු, පරිසරය අඳින්නත්, ඉරියව් අඳින්නත් උනන්දු වෙලා තියෙනවා." පින් තමන් දන්න තරමින් පැහැදිලි කළා.

බන්දුල හරිස්චන්ද්‍ර මහත්තයව බලන්න යන්න ඉඩක් ලැබුණේ මේ දවස්වල ටිකක් විවේකීව ඉන්න නිසා. පානදුර හොරණ පාරේ කුරුස හන්දියෙන් හැරිලා ගියාමයි මාස්ටර්ගේ මේ නිස්කලංක නිවහන හමුවෙන්නෙ. මාස්ටර්ගේ චිත්‍ර දෙක තුනකුයි කුසුම් මංගලිකා ශිල්පිනියගේ චිත්‍ර දෙක තුනකුයි ආලින්දයේ, කෑම කාමරයේ බිත්ති සැරසිලා තිබුණා. ඒ වගේම ගෙදර ඉදිරියේ බිත්ති බදාමයෙන් කරපු කැටයම් (මියුරල්)වලින් සැරසිලා තිබුණ නිසා ගේ හොයාගන්න පහසුයි.

මෙල්බන් නුවර අපි අතරේ ඉන්න ශ්‍රීනාත් කුරකුලසූරිය ප්‍රවීණ චිත්‍ර ශිල්පියාණන්වත් ආදරයෙන් මතක් කරන්න මේ දෙපළම අමතක කළේ නෑ.

බන්දුල හරිස්චන්ද්‍ර මාස්ටර්ව බැහැදකින්න ගිය පින්ට ලැබුණ පැස්ටල් චිත්‍රය බොහොම වටිනා තිළිණයක් වුණා.



සිසිර දිසානායක

සම්බන්ධීකරණය වෙනුවෙන් ස්තුතිය
ලකී ලියනගේ සොයුරාට

## චිනී හෙට්ටිගොඩ

